
කම්කරු දෙපාර්තමේන්තුව

කම්කරු දෙපාර්තමේන්තුවෙහි
කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන - බාණ්ඩ 2 සේවා ගණයේ
ලඝු ලේඛක III ශ්‍රේණියේ තනතුර සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2026

කම්කරු දෙපාර්තමේන්තුවෙහි පුරප්පාඩුව පවත්නා කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන - බාණ්ඩ 2 සේවා ගණයේ ලඝු ලේඛක තනතුරු සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද බඳවා ගැනීමේ පරිපාටියේ විධිවිධාන අනුව විවෘත පදනම් මත බඳවා ගැනීමට කටයුතු කෙරේ. අයදුම්පත් කැඳවන අවසාන දිනට, එනම් 2026.12.14 දිනට පහත 3.0 වන ඡේදයේ සඳහන් සුදුසුකම් සම්පූර්ණ කර ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1.0 **බඳවා ගැනීමට අපේක්ෂිත තනතුරු සහ පුරප්පාඩු සංඛ්‍යාව**

අනු. අංකය	*තනතුරු නාමය*	*පුරප්පාඩු සංඛ්‍යාව*
1	ලඝු ලේඛක (සිංහල මාධ්‍යය)	09
2	ලඝු ලේඛක (ඉංග්‍රීසි මාධ්‍යය)	01

1.1 තනතුරෙහි / තනතුරුවල ස්වභාවය: ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය.

1.2 තනතුරුවල රාජකාරී ස්වභාවය :

	අනුමත තනතුරු නාම	*කාර්යයන්*
1	ලඝු ලේඛක	- කාර්මික අධිකරණයේ නඩු විමසීම්වල කාර්ය සටහන් ලඝු ලේඛනය කිරීම - සේවය අවසන් කිරීමේ අංශයේ සහ කාර්මික සම්බන්ධතා අංශයේ පරීක්ෂණවල කාර්යය සටහන් ලඝු ලේඛනය කිරීම - පඩි පාලක සභා රැස්වීම්වල කාර්යය සටහන් ලඝු ලේඛනය කිරීම - ඉහත අවස්ථාවල දී හා අනෙකුත් දෙපාර්තමේන්තු අවශ්‍යතාවයන්වලදී ලබා ගන්නා සියළුම කාර්යය සටහන් පරිගණක යතුරු ලියනය කර මුද්‍රිත පිටපත් ලබා ගැනීම - තනතුරට අදාළව දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් පවරනු ලබන වෙනත් රාජකාරි

Gazette.lk SINCE 2014 AMBITIONS REALIZED

2.0 බඳවා ගැනීමේ ක්‍රමය :

මෙම බඳවා ගැනීමේ විවෘත තරග විභාගය ලිඛිත පරීක්ෂණයකින් හා වෘත්තීය පරීක්ෂණයකින් සමන්විතය. පළමුව ලිඛිත පරීක්ෂණය පැවැත්වෙන අතර ප්‍රශ්න පත්‍රයෙන් 40% ට වඩා ලකුණු ලබා ගන්නා අපේක්ෂකයින් වෘත්තීය පරීක්ෂණයට කැඳවනු ලැබේ. මෙම විභාගය තරඟ විභාගයක් බැවින් පත්වීම ලැබීමට සුදුසුකම් ලැබීම සඳහා එක් එක් විෂයය සඳහා වෙන් කර ඇති ලකුණුවලින් යටත් පිරිසෙයින් 40%ක් බැගින් වත් අපේක්ෂකයින් විසින් ලබා ගත යුතු ය. තරඟ විභාගය සඳහා වෙන් කොට ඇති පුරප්පාඩු ගණන සපුරාලන පරිදි ලබාගත් මුළු ලකුණු අනුපිළිවෙල අනුගමනය කරමින් පුරප්පාඩු සම්පූර්ණ කරනු ලැබේ. (මෙම දැන්වීමේ සඳහන් සුදුසුකම් සියල්ලම සපුරා තිබීම අනිවාර්ය වේ.)

විභාගය සිංහල හා ඉංග්‍රීසි මාධ්‍යයවලින් පැවැත්වෙන අතර, ඉල්ලුම් කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ. අයදුම්කරුවන්ට තමාට කැමති ඕනෑම භාෂා මාධ්‍යයකින් ලිඛිත විභාගය සඳහා පෙනී සිටිය හැකිය. ලඝුලේඛක සිංහල තනතුර සඳහා අයදුම්කළ අයදුම්කරුවන්ගේ මුළු ලකුණු කුසලතාවය අනුව එම තනතුරු සඳහා ද ලඝුලේඛක ඉංග්‍රීසි තනතුර සඳහා අයදුම්කළ අයදුම්කරුවන්ගේ මුළු ලකුණු කුසලතාවය අනුව එම තනතුරු සඳහා ද පත් කිරීම සිදු කරනු ලැබේ.

3.0 සුදුසුකම් :

3.1 අධ්‍යාපන සුදුසුකම්

3.1.1 සිංහල මාධ්‍යය අයදුම්කරුවන් සඳහා

(*අ*)

- සිංහල භාෂාව
- ගණිතය සහ
- තවත් විෂයයන් දෙකකට (02) සම්මාන සාමාර්ථ සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා/පෙළ) විභාගය සමත්ව තිබීම

(*ආ*) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගයේදී අවම වශයෙන් විෂයයන් එකක්වත් (01) (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත් වීම.

3.1.2 ඉංග්‍රීසි මාධ්‍යය අයදුම්කරුවන් සඳහා

(*අ*)

- ඉංග්‍රීසි භාෂාව
- ගණිතය සහ
- තවත් විෂයයන් දෙකකට (02) සම්මාන සාමාර්ථ සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා/පෙළ) විභාගය සමත්ව තිබීම

(*ආ*) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගයේදී අවම වශයෙන් විෂයයන් එකක්වත් (01) (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත් වීම.

3.2 වෘත්තීය සුදුසුකම් :

- *සිංහල මාධ්‍යය අයදුම්කරුවන් සඳහා*
  තෘතීයික සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයක ලඝු ලේඛනය හා පරිගණක යතුරු ලියනය (සිංහල මාධ්‍යය) පිළිබඳ මාස හය (06) කට නොඅඩු පාඨමාලාවක් හදාරා තිබීම හෝ අ.පො.ස. (සා.පෙළ) විභාගයේ දී විද්‍යුත් ලේඛනකරණය හා ලඝු ලේඛනය විෂයය (සිංහල මාධ්‍යය) සම්මාන සාමාර්ථයක් ලබා තිබීම

- *ඉංග්‍රීසි මාධ්‍යය අයදුම්කරුවන් සඳහා*
  තෘතීයික සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයක ලඝු ලේඛනය හා පරිගණක යතුරු ලියනය (ඉංග්‍රීසි මාධ්‍යය) පිළිබඳ මාස හය (06) කට නොඅඩු පාඨමාලාවක් හදාරා තිබීම හෝ අ.පො.ස. (සා.පෙළ) විභාගයේ දී විද්‍යුත් ලේඛනකරණය හා ලඝු ලේඛනය විෂයය (ඉංග්‍රීසි මාධ්‍යය) සම්මාන සාමාර්ථයක් ලබා තිබීම.

  සටහන: ලඝු ලේඛනය හා පරිගණක යතුරු ලියනය සඳහා තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් අනුමත ආයතන පහත දැක්වේ :

- කාර්මික හා අධ්‍යාපන පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවට අයත් කාර්මික විද්‍යාල හා තාක්ෂණ විද්‍යාල;
- ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරියට අයත් පුහුණු මධ්‍යස්ථාන;
- ජාතික තරුණ සේවා සභාවට අයත් පුහුණු මධ්‍යස්ථාන;
- ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියට අයත් පුහුණු මධ්‍යස්ථාන.

3.3 කායික සුදුසුකම් :
සෑම අයදුම්කරුවෙකුම ශ්‍රී ලංකාව තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හා තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.

SINCE 2014 Gazette.lk AMBITIONS REALIZED

3.4 වෙනත් සුදුසුකම් :

- ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතු ය;
- අයදුම්කරු විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය;
- පැවිදි පුද්ගලයෙකු හෝ ආගමික නිකායක පූජකවරයෙකු නොවිය යුතු ය;
- සේවයට බඳවා ගැනීම සඳහා වන තරග විභාගයට පෙනී සිටීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිගනු ලබන්නේ අයදුම්කරු අදාළ සියලු සුදුසුකම් හා නියමිත වයස් සීමාව අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබෙන්නේ නම් පමණි.

4.0 වයස් සීමාව :

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට අවම වයස අවුරුදු 18ට නොඅඩු විය යුතු අතර, උපරිම වයස අවුරුදු 30ට නොවැඩි විය යුතු ය.

5.0 සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි හා සේවා කොන්දේසි :

5.1 මෙම පත්වීම අවුරුදු තුනක (03) පරිවාස කාලයකට යටත් වේ.

5.2 III ශ්‍රේණියට බඳවා ගෙන වසර තුන (03) ක් ගත වීමට පෙර I වන කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුතු ය.

5.3 රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබා ගැනීම සම්බන්ධයෙන් 2020.10.16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020 හි විධිවිධාන හා ඊට ආනුෂාංගික වන චක්‍රලේඛවල විධිවිධාන මෙයට අදාළ වේ.

5.4 රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලට ද, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති, මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහයේ විධිවිධානවලට සහ ඒවායේ සිදු කෙරෙන සංශෝධනවලට ද, දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝගවලට ද, 2013.04.11 වැනි දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද බඳවා ගැනීම් පටිපාටියේ පනවා ඇති නියමයන් හා කොන්දේසිවලට ද එම බඳවා ගැනීම් පටිපාටියට මින් මතු කෙරෙන සංශෝධනවලට ද යටත්ව තෝරා ගනු ලබන අපේක්ෂකයින් ලඝු ලේඛක III ශ්‍රේණියේ තනතුරට පත් කරනු ලැබේ.

5.5 කොළඹ 05, නාරාහේන්පිට පිහිටි කම්කරු දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ පමණක් සේවයේ යොදවනු ලැබේ.

6.0 වැටුප් පරිමාණය :

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 දරන වැටුප් චක්‍රලේඛයෙහි MN – 1 - 2025 අනුව මෙම තනතුරට අදාළ මාසික වැටුප් ප්‍රමාණය රු. 45,230 – 10×540 - 11×630 - 10×890 – 10×1,190 - රු. 78,360/- වේ.

7.0 ලිඛිත විභාගය හා වෘත්තීය පරීක්ෂණය :

7.1 ලිඛිත විභාගය

ප්‍රශ්න පත්‍රය	*කාලය*	*උපරිම ලකුණු ප්‍රමාණය*	*සමත් ලකුණු ප්‍රමාණය*
– සිංහල මාධ්‍යය අයදුම්කරුවන් සඳහා සාමාන්‍ය දැනීම සහ වාක්‍ය රචනය (සිංහල මාධ්‍යය) – ඉංග්‍රීසි මාධ්‍යය අයදුම්කරුවන් සඳහා සාමාන්‍ය දැනීම සහ වාක්‍ය රචනය (ඉංග්‍රීසි මාධ්‍යය)	පැය 02	100	40%

SINCE 2014 Gazette.lk AMBITIONS REALIZED

(*අ*) ලිඛිත විභාගයේ විෂයය නිර්දේශය :
සාමාන්‍ය දැනීම හා වාක්‍ය රචනය

– දේශීය හා ජාත්‍යන්තර ක්ෂේත්‍රවල කාලීන සිදුවීම් පිළිබඳ සාමාන්‍ය දැනීම පරීක්ෂා කිරීම
– කාලීන වැදගත්කමින් යුත් දෙන ලද මාතෘකා අතුරින් තෝරාගත් මාතෘකාවක් යටතේ රචනාවක් ලිවීම (සුවිශේෂී අදහස් ඉදිරිපත් කිරීම, භාෂා කුසලතාව, නිවැරදි ව්‍යාකරණ හා අක්ෂර වින්‍යාසය කෙරෙහි සැලකිල්ලක් දක්වනු ලැබේ).

7.2 වෘත්තීය පරීක්ෂණය :

විෂයය	*උපරිම ලකුණු ප්‍රමාණය*	*සමත් ලකුණු ප්‍රමාණය*
– සිංහල මාධ්‍යය අයදුම්කරුවන් සඳහා ලඝු ලේඛනය හා යතුරු ලියනය (සිංහල මාධ්‍යය) – ඉංග්‍රීසි මාධ්‍යය අයදුම්කරුවන් සඳහා ලඝු ලේඛනය හා යතුරු ලියනය (ඉංග්‍රීසි මාධ්‍යය)	100	40

(*ආ*) වෘත්තීය පරීක්ෂණය සඳහා වන විෂය නිර්දේශය :

– *සිංහල මාධ්‍යය අයදුම්කරුවන් සඳහා*
මිනිත්තු පහක් (5) තුළ නොකඩවා කියවනු ලබන ඡේදයක් මිනිත්තුවකට වචන 70 ක වේගයෙන් ලඝු සටහන් කරගෙන එම සටහන් මිනිත්තුවකට වචන 7 ක වේගයෙන් පරිගණක යතුරු ලියනය කිරීම.

– *ඉංග්‍රීසි මාධ්‍යය අයදුම්කරුවන් සඳහා*
මිනිත්තු පහක් (5) තුළ නොකඩවා කියවනු ලබන ඡේදයක් මිනිත්තුවකට වචන 80 ක වේගයෙන් ලඝු සටහන් කරගෙන එම සටහන් මිනිත්තුවකට වචන 7 ක වේගයෙන් පරිගණක යතුරු ලියනය කිරීම.

08.0 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය :

සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා පමණක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලබන අතර ලකුණු ලබා දෙනු නොලැබේ.
***සැලකිය යුතු යි.*
සම්මුඛ පරීක්ෂණයට සහභාගි වීම පත්වීම පිරිනැමීමට සුදුසුකම් සම්පූර්ණ කිරීමක් සේ සලකනු නොලැබේ.

09.0 විභාග ගාස්තුව:

මෙම විභාගය සඳහා ගාස්තුව රු. 500/- කි. එම විභාග ගාස්තුව කම්කරු කොමසාරිස් ජනරාල් නමින් ඇති මහජන බැංකුවේ තිඹිරිගස්යාය ශාඛාවේ අංක 086100169026274 දරන ගිණුමට බැර කර ඒ සඳහා නිකුත් කරන කුවිතාන්සිය අයදුම්පත්‍රයට නොගැලවෙන සේ අලවා එවිය යුතු ය.
(මෙම ලදුපතේ ඡායා පිටපතක් අපේක්ෂකයා ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.)

සටහන : විභාගය අවලංගු කළහොත් මිස විභාග ගාස්තු කුමන හේතුවක් නිසාවත් නැවත ගෙවනු නොලැබේ. මෙම විභාගය සඳහා ගෙවනු ලැබූ විභාග ගාස්තු වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමට ද නොහැකිය.

10.0 අයදුම්කිරීමේ ක්‍රමය :

10.1 මෙම නිවේදනය අවසානයේ දක්වා ඇති ආදර්ශ අයදුම්පත අනුව සෙ.මී 21 × 29 (A4) ප්‍රමාණයේ කඩදාසිවල දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් තමන් විසින් ඉල්ලුම්පත්‍රය සකස් කරගත යුතුය. අංක 1.0 සිට 7.1 දක්වා ශීර්ෂ 01 පිටුවේ ද, අංක 07.2 සිට 11.2 දක්වා 02 පිටුවේ ද, අංක 12.0 සිට 15.0 දක්වා 03 පිටුවේ ද, අංක

Gazette.lk SINCE 2014 AMBITIONS REALIZED

16.0 සිට 17.0 දක්වා 04 පිටුවේ ද ඇතුළත් වන පරිදි ඉල්ලුම් පත්‍රය සැකසිය යුතු ය.

10.2 අයදුම්පත් සකස් කළ යුත්තේ තමා විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යයෙන් ය.

10.3 නියමිත ආදර්ශ ආකෘතියට අනුකූල නොවන හා නිවැරදිව සම්පූර්ණ කර නොමැති අසම්පූර්ණ තත්ත්වයේ පවතින අයදුම්පත්‍ර කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

10.4 මෙම විභාගය කොළඹ නගරයේ පිහිටුවන ලබන විභාග මධ්‍යස්ථානවල පමණක් පැවැත්වේ.

10.5 අයදුම්පත් ලද බව දන්වනු නොලැබේ. තැපෑලේදී අස්ථාන ගත වන ඉල්ලුම්පත් සම්බන්ධව කෙරෙන කිසිදු පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ.

10.6 තරග විභාගයට පෙනී සිටීම සඳහා ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම අයදුම්කරු මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ.

10.7 අයදුම්පත්‍රය බහා එවන කවරයේ වම් පස ඉහල කෙළවරේ "**කම්කරු දෙපාර්තමේන්තුවෙහි කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන - බාණ්ඩ 2 සේවා ගණයේ ලඝු ලේඛක III ශ්‍රේණියේ තනතුර සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2026**" යනුවෙන් පැහැදිලිව සඳහන් කළ යුතු ය.

10.8 අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයෙකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරී බලයලත් නිලධාරියෙකු, පොලිස් සේවයේ *ගැසට්* කළ තනතුරක් දරන නිලධාරියෙකු හෝ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 10/2025 ශ්‍රේණිගත කිරීම අනුව තෘතීය හෝ ජ්‍යෙෂ්ඨ මට්ටමේ රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු හෝ විසින් සහතික කරනු ලැබ තිබිය යුතු ය.

10.9 මෙම පුරප්පාඩු පිරවීම, නොපිරවීම හෝ පුරප්පාඩු වලින් කොටසක් පිරවීම හා අනෙකුත් සියලුම කරුණු පිළිබඳව අවසන් තීරණය කම්කරු කොමසාරිස් ජනරාල් සතු වන්නේ ය.

11.0 අයදුම්පත යොමු කිරීම:

සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍ර 2026.12.14 වැනි දින හෝ ඊට පෙර පහත දැක්වෙන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

කම්කරු කොමසාරිස් (ආයතන)
කම්කරු දෙපාර්තමේන්තුව
08 වන මහල
"මෙහෙවර පියෙස" ගොඩනැගිල්ල
කොළඹ 05

12.0 විභාගයට පෙනී සිටීම:

(අ) සෑම ආකාරයකින් ම සම්පූර්ණ අයදුම්පත් එවා ඇති නිවේදනයේ සඳහන් සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් හට පමණක් විභාගය පවත්වන දිනට සතියකට කලින් ලැබෙන සේ ශ්‍රී ලංකා පදනම් ආයතනය විසින් ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත.

(ආ) අපේක්ෂකයින් හට තමා විසින් ලබා දී ඇති ජංගම දුරකතන අංකය වෙත කෙටි පණිවුඩයක් හරහා ද ප්‍රවේශ පත්‍රය බාගත කර ගැනීම සඳහා සබැඳියක් (Link) සපයනු ලැබේ. එමගින් අපේක්ෂකයින්ගේ ජාතික හැඳුනුම්පත් අංකය ඇතුළත් කර ප්‍රවේශ පත්‍රය තැපෑලෙන් නොලැබුණහොත් මෙසේ බාගත කර ගැනීමේ හැකියාව පවතී. තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන කිසිදු අපේක්ෂකයෙකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

(ඇ) අපේක්ෂකයෙකු තමාට නියම කර ඇති විභාග ශාලාවේදී නියමිත විභාග අංකය යටතේ විභාගයට පෙනී සිටිය යුතුය. විභාගයට පෙනී සිටින සෑම අපේක්ෂකයෙකුම විභාගය පවත්වන දින තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය විභාග ශාලාධිපති වෙත භාර දිය යුතුය.

13.0 අපේක්ෂකයාගේ අනන්‍යතාවය:

විභාග ශාලාවේදී තමා පෙනී සිටින විෂයයන් සම්බන්ධයෙන් ම විභාග ශාලාධිපති සෑහීමට පත්වන අයුරින් අයදුම්කරුවන් තම අනන්‍යතාවය ඔප්පු කර සිටිය යුතු ය. මේ සඳහා පහත සඳහන් ලේඛන පිළිගනු ඇත.

(අ) පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත,
(ආ) වලංගු විදේශ ගමන් බලපත්‍රය,
(ඇ) වලංගු රියදුරු බලපත්‍රය.

Gazette.lk AMBITIONS REALIZED
SINCE 2014 Gazette.lk AMBITIONS REALIZED

14.0 **සාවද්‍ය තොරතුරු සැපයීමට දඬුවම්:**

යම් අපේක්ෂකයෙකුට මෙම ලිඛිත පරීක්ෂණය සඳහා පෙනී සිටීමට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට කලින් හෝ විභාගය පවත්වන අතරතුරදී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවකදී ඔහුගේ / ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. අපේක්ෂකයෙකු ඉදිරිපත් කර ඇති කිසියම් කරුණක් සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෙලිවුවහොත්, එසේ නැත්නම් යම් වැදගත් කරුණක් ඔහු / ඇය ඕනෑකමකින් යටපත් කර ඇත්නම් ඔහු / ඇය සේවයෙන් පහ කිරීමට ඉඩ ඇත.

15.0 මෙම *ගැසට් නිවේදනයේ* සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු වන්නේ ය.

එච්. එම්. ඩී. එන්. කේ. වටලියද්ද,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2026ක්වූ නොවැම්බර් මස 02,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

Gazette.lk AMBITIONS REALIZED